A3 - 04    A4 - 02

සියලු ම හිමිකම් ඇවිරිණි ]
முழுப் பதிப்புரிமையுடையது ]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | නාට්‍ය හා රංග කලාව 1 පත්‍රය<br>கணிதம் வினாத்தாள்-1<br>**Drama & Theatre - Paper -1** | පැය එකයි<br>ஒரு மணித்தியாலம்<br>one Hour |

**සැලකිය යුතුයි :**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකය හා සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**

01. පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් නාට්‍යය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
    1. නාට්‍යය ක කිසියම් අවස්ථාවක් හෝ සිද්ධියක් තිබිය යුතුය.
    2. නාට්‍ය යන්නෙහි සරල ම අදහස වනුයේ යමක් කර පෙන්වීමයි.
    3. නාට්‍යය ක කතාව ගොඩ නැංවීම සඳහා තෝරාගත් සිද්ධි පිළිවෙළින් පෙළ ගැස්වීම අත්‍යවශ්‍ය වේ.
    4. නාට්‍යයේ සිද්ධි හෝ අවස්ථා නිරූපණයට ප්‍රබල සංවාද යොදාගත යුතුය.

02. ස්ථාවර පුළුල් කෝණයකින් ආලෝකය සැපයීමටත්, පසුබිම හා අවකාශය ද පොදුවේ මුළු වේදිකාව ආලෝකමත් කිරීමටත් යොදාගනු ලබන පහන් විශේෂය වනුයේ,
    1. ධාරා පහන් ය.  2. යොමු පහන් ය.
    3. ක්ෂණ පහන් ය.  4. තිරු පහන් ය.

03. නාට්‍යය ක භාවිත වේශ භූෂණ පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වනුයේ,
    1. නාට්‍යය ක වේශ භූෂණ, නළුවකුගේ සමාරෝපය කෙරේ බලපානු ඇත.
    2. වේශ භූෂණ නිර්මාණයේදී නළුවාගේ ජවි වර්ණය පිළිබඳ ව සැලකිලිමත් විය යුතුය.
    3. වේශ භූෂණ නිර්මාණයේදී රංගාලෝකය පිළිබඳ සැලකිලිමත් විය යුතු නැත.
    4. වේශ භූෂණ ආහාර්ය අභිනය ට අයත් වේ.

04. මූලික අංග රචනා ප්‍රභේද,
    1. 2 කි.  2. 3 කි.  3. 4 කි.  4. 5 කි.

05. නාට්‍ය සංගීතය අයත් වනුයේ,
    1. වාචික අභිනයට ය.  2. සාත්ත්වික අභිනයට ය.
    3. ආංගික අභිනයට ය.  4. ආහාර්ය අභිනයට ය.

06. පහත දැක්වෙන කරුණු අතරින් නාට්‍ය සංගීතය පිළිබඳ සාවද්‍ය කරුණ වනුයේ,
    1. නාට්‍යයේ ශෛලිය ට අනුගත ව සංගීතය යොදා ගත යුතු ය.
    2. නාට්‍යයේ තේමාව ට උචිත ලෙසින් සංගීතය භාවිත කළ යුතු ය.
    3. නාට්‍ය සංගීතය නළු නිළියන්ගේ රංගය අභිබවා යන සේ නිර්මාණය කළයුතු ය.
    4. නාට්‍යමය අවස්ථා අතර සම්බන්ධතාව රැක ගැනීමට ද නාට්‍ය සංගීතය යොදාගත හැකිය.

• පහතින් දැක්වෙනුයේ රංග භූමි අලංකරණය පිළිබඳ මිතුරන් තිදෙනෙකුගේ සංවාදයකින් උපුටා ගත්තකි. ඒ ඇසුරින් පහත ප්‍රශ්නය ට පිළිතුරු සපයන්න.

පසන් : මම නං අහල තියෙන්නේ නාට්‍යයකට රංග භූමි අලංකරණයක් අත්‍යවශ්‍ය ම නැහැ කියලයි.

රවිඳු : ඒක වැරදියි පසන්, රංග භූමි අලංකරණ නැතුව නාට්‍යයක් සම්පූර්ණ වෙන්නෙ නැනේ.

යසස් : ඒක කොහොම වෙතත්, රංග භූමි අලංකරණයක් භෞතික ද්‍රව්‍ය වලින් විතරක් නෙමේලු, නළු නිළියන් යොදාගෙන උනත් කරන්න පුලුවන් ලු.

රවිඳු : ඒක බොරු කතාවක්, නලු නිළියෝ යොදාගත්තහම ඒක රංග අලංකරණයක් කියන්නේ නෑ. ඒකට රංග වින්‍යාසය කියලයි කියන්නේ.

07. ඉහත සංවාදය ට අනුව නිවැරදි මත පළ කරනුයේ,

1. පසන් හා රවිඳු ය. 2. රවිඳු හා යසස් ය.
3. පසන් හා යසස් ය. 4. රවිඳු පමණි.

08. පහතින් දැක්වෙනුයේ නාට්‍ය ප්‍රේක්ෂකයා පිළිබඳ ව ප්‍රකාශිත මත කිහිපයකි.

A. ප්‍රේක්ෂකයාට යනු නාට්‍ය දර්ශනයකට අත්‍යවශ්‍ය ම සාධකයකි.
B. ප්‍රේක්ෂකයා විචාරකයකු, රසිකයකු මෙන්ම විනිශ්චය කරුවකු ද වේ.
C. ප්‍රේක්ෂකයාට නාට්‍යය නිර්දය ලෙස විවේචනය කිරීමේ ශක්තියක් තිබිය යුතුය.

මෙම කරුණු අතරින් ගුණාත්මක නාට්‍ය ප්‍රේක්ෂකයකු සම්බන්ධ කරුණු වනුයේ,

1. A හා B පමණි 2. B හා C පමණි
3. A හා C පමණි 4. A,B,C යන ප්‍රකාශ තුනම නිවැරදිය.

09. පිටපතකින් තොර ව සීමිත කාලයක් තුළ දෙන ලද ඉඟියකට අනුව කිසියම් අවස්ථාවක්, සිද්ධියක් නිරූපණය කිරීම හඳුන්වනුයේ,

1. අභිරූපණය නමිනි. 2. ක්ෂණික නිරූපණය නමිනි.
3. චරිත නිරූපණය නමිනි. 4. අනුකරණය නමිනි.

10. අභිරූපණ රංගනයක් සඳහා රූපණ ශිල්පියා මූලිකව ම භාවිත කරනු ලබන අභිනය ප්‍රභේදය වනුයේ,

1. ආංගික අභිනය යි. 2. වාචික අභිනය යි.
3. සාත්ත්වික අභිනය යි. 4. ආහාර්ය අභිනය යි.

11. නළුවකුට සිය චරිත නිරූපණය සඳහා බෙහෙවින් ම වැදගත් සාධකය වනුයේ,

1. නාට්‍ය පිටපත යි. 2. අධ්‍යක්ෂවරයාගේ උපදෙස් ය
3. නළුවාගේ නිර්මාණශීලි චින්තනය යි. 4. නළුවාගේ පරිකල්පන ශක්තිය යි.

12. නාට්‍යමය අවස්ථාවක මූලික ලක්ෂණයක් නොවනුයේ,

1. ගැටුම් අන්තර්ගත අවස්ථාවක් වීමයි.
2. රඟපා පෙන්විය හැකි අවස්ථාවක් වීමයි.
3. ප්‍රේක්ෂකයා තුළ කුතුහලය, ආතතිය මතුවන අවස්ථාවක් වීමයි.
4. කියවා රස විඳිය හැකි අවස්ථාවක් වීම යි.

- **පහත දැක්වෙන දෙබස් /සංවාද/ ඒකල භාෂණ ඛණ්ඩ කියවා, අංක 13 සිට 16 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

අ. ගෘෲෂා :- විස්ස තිහ වුණත් මට කමක් නෑ. මම කියලා දෙන්නම් ඔහේගෙ නිතිය ගැන. ඔහේ දන්න ඉටි ගෙඩියක් නෑ නිතිය ගැන. ඔහේ නිකම් බෙරි වෙච්ච ඌෑනු බිකක්

ආ. සේපාලිකා :- (තමාට ම) කොච්චර අපූරු මහත්මයෙක් ද ? දැනුයි මට එයා හොඳට දැන ගන්ඩ පුළුවන් උනේ. කතා බස් කරපුවා ම කාට උනත් ආසා හිතෙනවා කොච්චර හැදිච්ච නිවිච්ච මහත්මයෙක් ද ?

ඉ. ඇබිත්තයා :- ඔන්න මම තේ වතුර වත් කරගෙන ආහම මේ මහත්තුරු එක්කෙනෙක්වත් නෑ. තේ බොන්ඩ මතක නැතිව ඇවිදින්ඩ යන්ඩ ඇති. ඔහොම තමයි ඕගොල්ලගෙ හැටි. වීදුරු දෙකක් තිබුණ ඒකෙනුත් එකක් කඩලා. දැං තියෙනන්නේ මේ වීදුරුව විතරයි.

උ. සිදඟන :-

ඇයි ද යකුනි තොපි පෙරළි කරන්නේ
කැකෝ ගහමින් බේරි හඬ දෙන්නේ
නිසංසලේ අපි මෙතන සිටින්නේ
එහෙව් අපට ඇයි තොපි ඉන්ට නොදෙන්නේ

එ. ගුරු :- (පැංචාගෙන් ශබ්දයක් නැති බව හැඟී ඒ පැත්ත බලයි. කාරණය වැටහෙයි. ප්‍රේක්ෂකයන් වෙත සිනහවක් පා, පැංචා වෙත ගොස්) බොල මෝඩයෝ ....... තුන්වැනි පාදය කියන්නෙ ...... මේ ශ්ලෝකයේ තුන්වැනි පාදය (පැංචාට යළිත් ගසන්නට යයි)

ඔ. කුමරා වචනය :- වසන්ත ශ්‍රීයෙන් අලංකාර වූ, මගුල් මඩුවකට බඳුවූ වනාන්තරයේ ශෝභාව නරඹමින් යනවිට ගමන් විඩාව ඉබේම මඟ හැරේ, සොඳුර. වන රැජින ද උත්සව විලාසයෙන් නෙක් විසිතුරු පාන්නී අප දෙදෙනාගේ විවාහය නිසා සතුටු වන්නා සේ ය.

13. ඉහත දෙබස් /සංවාද/ ඒකල භාෂණ ඛණ්ඩ අතුරින් පරිවර්තන නාට්‍යයක් දැක්වෙන අක්ෂරයන් අන්තර්ගත පිළිතුර වනුයේ,
 1. "අ" යන්නයි. 2. "ඉ" යන්නයි. 3. "ආ" යන්නයි. 4. "උ" යන්නයි.

14. ඉහත දෙබස් /සංවාද/ ඒකල භාෂණ ඛණ්ඩ අතුරින් නාට්‍ය ධර්මී ශෛලියට අයත් නාට්‍යයන් පමණක් දැක්වෙන අක්ෂරයන් අන්තර්ගත පිළිතුර වනුයේ,
 1. "අ" සහ "උ" යන්නයි.
 2. "ආ" සහ "උ" යන්නයි.
 3. "ඉ" සහ "එ" යන්නයි.
 4. "උ" සහ "ඔ" යන්නයි.

15. ඉහත දෙබස් /සංවාද/ ඒකල භාෂණ ඛණ්ඩ අතුරින් අනුවර්තන නාට්‍යයන් පමණක් දැක්වෙන අක්ෂරයන් අන්තර්ගත පිළිතුර වනුයේ,
 1. "අ" සහ "ඉ" යන්නයි.
 2. "ඉ" සහ "එ" යන්නයි.
 3. "ආ" සහ "උ" යන්නයි.
 4. "උ" සහ "එ" යන්නයි.

16. ඉහත දෙබස් /සංවාද/ ඒකල භාෂණ ඛණ්ඩ අතුරින් මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් නිෂ්පාදිත නාට්‍යයන් පමණක් දැක්වෙන අක්ෂරයන් අන්තර්ගත පිළිතුර වනුයේ,
 1. "ආ" සහ "ඉ" යන්නයි.
 2. "ආ" සහ "ඔ" යන්නයි.
 3. "උ" සහ "ඔ" යන්නයි.
 4. "එ" සහ "ඔ" යන්නයි.

- **පහත සඳහන් නාට්‍ය ගීත ඛණ්ඩ ඇසුරෙන් අංක 17 සිට 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

ක. පාට මරුණ පුත - පරමණ්ඩල් පුත
නුඹ නාඩන් පුත - හරිරාරෝ
නින්ද තොටිල්ලේ - නැළවෙන මගෙ පුත
නුඹ නාඩන් පුත - හරිරාරෝ

ග. ගම්හිර තෙදැති කොන්ස්තන්තිනු පුරේ
පුර වර්ධන කරන අග නරනා මෙ මං
නාමය මං - අලිසන්දිරි
මම ධර්මෙන් මෙපුර පාලන කරමින්නේ
ඉන්නේ මැදුරෙ ප්‍රීතිය විඳිමින්නේ

ච. සිරි සංඝබෝධි මාලිගාවේදී මා
දැක ප්‍රාණෙ හානි වෙන්ට බැට දෙමි
අල්ලා බන්දා රන්දා බින්දා උන්දැ කුන්දා ලාමි සින්දා
සැන්දෑ කාලෙ මාලිගාවෙ ඉන්නවා සොයා

ට. ආලවෙලා පියසේ පටන්
මම කෝළ නැතිව සබයේ මෙ දැන්
බාල මේමගේ වැරදි නොගන්
මෙම රාළහාමිල මට ආයුබෝවන්

ඩ. දිකිරි දිකිරි ගෙනාව දි කිරි
මිහි පිට කාටත් ගුණ දෙන මේ කිරි
පැටියා මෝරපු දෙන ගෙන් ගත් කිරි
හොඳ හැටි උණු කර හින්දා ගත් කිරි

17. මින් සොකරි ගැමි නාටකය ට අදාළ ගීත ඛණ්ඩය දැක්වෙන අක්ෂරය වනුයේ,
1. "ක" යන්නයි. 2. "ග" යන්නයි. 3. "ච" යන්නයි. 4. "ට" යන්නයි.

18. මින් කෝලම් ගැමි නාටකය ට අදාළ ගීත ඛණ්ඩය දැක්වෙන අක්ෂරය වනුයේ,
1. "ග" යන්නයි. 2. "ච" යන්නයි. 3. "ට" යන්නයි. 4. "ඩ" යන්නයි.

19. මින් නාඩගම් ජන නාටකය ට අදාළ ගීත ඛණ්ඩය දැක්වෙන අක්ෂරය වනුයේ,
1. "ක" යන්නයි. 2. "ග" යන්නයි. 3. "ච" යන්නයි. 4. "ඩ" යන්නයි.

20. මින් නුර්ති ජන නාටකයක ට අදාළ ගීත ඛණ්ඩය දැක්වෙන අක්ෂරය වනුයේ,
1. "ග" යන්නයි. 2. "ච" යන්නයි. 3. "ට" යන්නයි. 4. "ඩ" යන්නයි.

• පහත දැක්වෙන ඡායාරූප ඇසුරෙන් අංක **21** සිට **24** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ත



ද




න



ප



බ



ම



21. මින් උඩරට නර්තන සම්ප්‍රදාය ට අයත් පෙළපාලිය ක ඡායාරූපය දැක්වෙන අක්ෂරය වනුයේ,

1. "ද" යන්නයි. 2. "ප" යන්නයි. 3. "බ" යන්නයි. 4. "ම" යන්නයි.

22. මින් ගර්භ සංරක්ෂණ ශාන්ති කර්මයක ට අයත් රංග පෙළපාලිය ක ඡායාරූපය දැක්වෙන අක්ෂරය වනුයේ,

1. "ත" යන්නයි. 2. "ද" යන්නයි. 3. "ප" යන්නයි. 4. "ම" යන්නයි.

23. මින් මඩු ශාන්ති කර්මයක ට අයත් රංග පෙළපාලිය ක ඡායාරූපය දැක්වෙන අක්ෂරය වනුයේ,

1. "ත" යන්නයි. 2. "ද" යන්නයි. 3. "බ" යන්නයි. 4. "ම" යන්නයි.

24. මින් එකම ශාන්ති කර්මයක ට අයත් නාට්‍යමය පෙළපාලි දැක්වෙන ඡායාරූප යුගලය ට අයත් අක්ෂරයන් වනුයේ,

1. "ත" සහ "ද" යන්නයි.
2. "න" සහ "ප" යන්නයි.
3. "ප" සහ "ම" යන්නයි.
4. "ද" සහ "බ" යන්නයි.

- **අංක 25 සිට 28 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත දැක්වෙන ඡායාරූප ඇසුරු කරගන්න.**

ය



ර



ල



ව



25. "ලෙඩක් නැති ලෙඩෙක්" නාට්‍යය නිෂ්පාදනය කරමින් නාට්‍ය ක්ෂේත්‍රයට අවතීර්ණ වූ නාට්‍යකරුවාගේ ඡායාරූපය දැක්වෙන අක්ෂරය වනුයේ ,
    1. "ය" යන්නය. 2. "ර" යන්නයි. 3. "ල" යන්නයි. 4. "ව" යන්නයි.

26. ශ්‍රී ලංකාවේ වීදි නාට්‍ය කලාවේ පුරෝගාමියා ලෙස සැලකෙන නාට්‍යකරුවාගේ ඡායාරූපය දැක්වෙන අක්ෂරය වුයේ,
    1. "ය" යන්නය. 2. "ර" යන්නය. 3. "ල" යන්නයි. 4. "ව" යන්නයි.

27. මෝදර මෝල නාට්‍යයේ ලියන මහත්මයා චරිතය ද, උක්දඬු ගින්න නාට්‍යයේ කාර් බහුරූපියා චරිතය ද, ද්විත්ව නාට්‍යයේ අන්තෝනියෝ බෙරුද්දි චරිතය, ආදි චරිත ගණනාවකට ම පණ පෙවූ සම්මානනීය නාට්‍යකරුවාගේ ඡායාරූපය දැක්වෙන අක්ෂරය වනුයේ,
    1. "ය" යන්නයි. 2. "ර" යන්නයි. 3. "ල" යන්නයි. 4. "ව" යන්නයි.

28. ස්වභාවික හා ශෛලිගත සම්ප්‍රදායන්ගේ සම්මිශ්‍රණයක් ලෙස මෙන්ම පර්යේෂණාත්මක කෘතියක් ලෙසද 1961 වර්ෂයේ බිහිවූ ජනේලය නාට්‍යයේ නිර්මාණකරුවාගේ ඡායාරූපය දැක්වෙන අක්ෂරය වනුයේ,
    1. "ය" යන්නය. 2. "ර" යන්නය. 3. "ල" යන්නයි. 4. "ව" යන්නයි.

- **අංක 29 සිට 32 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත සඳහන් වගුව උපයෝගී කර ගන්න.**

| ය | ර | ල | ව |
|---|---|---|---|
| මාතලන් | දස්කොන් | මායාදුන්නේ | කඩවුණු පොරොන්දුව |
| බ්‍රම්පෝඩි | නල රාජ චරිතය | රොඩී කෙල්ල | පෙරළෙන ඉරණම |
| බැලසන්ත | රාමායණය | පිටිසර කෙල්ල | වැරදුන කුරුමාණම |
| ඉයුජිත් | සිරිසඟබෝ | අම්මා | සැඟවුණු පිළිතුර |
| දිනකර | දුටුගැමුණු | සීදේවි | කපටි ආරක්ෂකයා |

29. ඉහත වගුවෙහි "ය" අක්ෂරයෙන් දැක්වෙනුයේ,
    1. නාඩගම් නාට්‍යයන්ය. 2. නූර්ති නාට්‍යයන් ය.
    3. ටීටර් නාට්‍යයන්ය. 4. මිනර්වා නාට්‍යයන් ය.

30. ඉහත වගුවෙහි "ර" අක්ෂරයෙන් දැක්වෙනුයේ,
    1. සිරිසේන විමලවීරයන්ගේ නාට්‍යයන් ය.
    2. බී.ඒ.ඩබ්.ජයමාන්නයන්ගේ නාට්‍යයන් ය.
    3. ජෝන්ද සිල්වාගේ නාට්‍යයන් ය.
    4. චාල්ස් ඩයස්ගේ නාට්‍යයන් ය.

31. මෙහි නූර්ති නාට්‍යයේ ම දිගුවක් ලෙස සැලකෙන නාට්‍ය ප්‍රභේදයක ට අයත් නාට්‍යයන් දැක්වෙනුයේ,
1. "ය" යන්නය. 2. "ර" යන්නය. 3. "ල" යන්නයි. 4. "ව" යන්නයි.

32. පසුකාලීනව චිත්‍රපට ලෙසද නිපදවූ එක්තරා නාට්‍ය ප්‍රභේදයක ට අයත් වූ නාට්‍යයන් දැක්වෙනුයේ,
1. "ය" යන්නය. 2. "ර" යන්නය. 3. "ල" යන්නයි. 4. "ව" යන්නයි.

- **අංක 33 සිට 37 දක්වා ප්‍රශ්නවලට නොගැලපෙන පිළිතුර තෝරන්න.**

33. නාට්‍යමය ලක්ෂණ අන්තර්ගත බෞද්ධ පූජා කර්මයන් වේ.
1. ආලවක දමනය 2. කාලියක්ෂණී දමනය
3. බෝධි පූජා කර්මය 4. යුගාසන බණ

34. පහතරට නර්තන සම්ප්‍රදාය ට අයත් ශාන්ති කර්ම වලදී වාදනය කරන බෙරයයි.
1. දික් බෙරය 2. ඝෝෂක බෙරය
3. ගැට බෙරය 4. යක් බෙරය

35. සොකරි නාටකය ට අයත් චරිතවේ.
1. පරයා 2. චුක්කිනියා 3. වෙදරාළ 4. ගුරුහාමි

36. විවිධ රූපණ ප්‍රභේද වේ.
1. අනුරූපණය 2. චරිත නිරූපණය
3. සමාරෝපය 4. භූමිකා නිරූපණය

37. තෙවැදෑරුම් රැඟුම් වලින්,
නෘත්ත වලට උදාහරණ වේ.
1. පහතරට නර්තනයේ එන තෙල්මේ නැටුම
2. පහතරට නර්තනයේ එන ශුද්ධ මාත්‍රා නැටුම
3. උඩරට නර්තනයේ එන ආවැන්දුම නැටුම
4. නිර්මාණාත්මක වන්නම් නැටුම

- **අංක 38 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත සඳහන් වගුව උපයෝගී කරගන්න.**

| මුල් කෘතිය | රචකයා | පරිවර්තිත කෘතිය / අනුවර්තිත කෘතිය | පරිවර්තක / අනුවර්තක |
|---|---|---|---|
| ඇන්ටිගනී | "ත" | ................................ | ආරියවංශ රණවීර |
| "ද" | ගාර්ෂියා ලෝර්කා | මූදු පුත්තු | ................................ |
| ඉක්නෙවිටාඉ | ................................ | "න" | බන්දුල ජයවර්ධන |

38. ඉහත වගුවෙහි "ත" අක්ෂරයෙන් දැක්වෙන හිස්තැනට සුදුසු නාට්‍ය රචකයා වනුයේ,
1. සැමුවෙල් බෙකට් ය 2. සොෆොක්ලීස් ය
3. ශ්‍රී හර්ෂ ය. 4. හෙන්රික් ඉබ්සන් ය.

39. ඉහත වගුවෙහි "ද" අක්ෂරයෙන් දැක්වෙන හිස්තැනට සුදුසු මුල් නාට්‍ය කෘතිය වනුයේ,
1. එව්රිමැන් ය 2. ද මැරේජ් ය
3. යෙර්මා ය. 4. රූඩන්ස් ය.

40. ඉහත වගුවෙහි "න" අක්ෂරයෙන් දැක්වෙන හිස්තැනට සුදුසු පරිවර්තිත/අනුවර්තිත නාට්‍ය කෘතිය වනුයේ,
1. බෙරහඬ ය. 2. ජන හතුරා ය
3. සකල ජන ය. 4. වෙස් මුහුණු ය.

සියලු ම හිමිකම් ඇවිරිණි ]
முழுப் பதிப்புரிமையுடையது ]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | නාට්‍ය හා රංග කලාව 11 පත්‍රය<br>கணிதம் வினாத்தாள்-11<br>**Drama & Theatre Paper -11** | පැය දෙකයි<br>ஒரு மணித்தியாலம்<br>Two Hours |

**සැලකිය යුතුයි :**

**පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. පහතින් දැක්වෙන සංවාද ඛණ්ඩය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පියා : ඔයාගෙ හින හැබෑ කරගන්න කෙල්ලව පුජා කරන එක වැරදියි හිල්ඩා. දරුවන්ට ආදරේ කරනවයි කියලා උන්ගෙ ළමා කාලය අපි බදු අරගෙන උන් ලවා අපේ හින හැබෑ කරන්න උන්ට වද දෙන එක වැරදියි හිල්ඩ. අනික ඔය එංගලන්තෙ වගේ රටවලදී එන අමුතු ප්‍රශ්නවලට මුහුණ දෙන්න තරම් තාම මේ කෙල්ල හැඩ ගැහිල නෑ.

මව : අනේ දෙයියනේ මං මේ හැම දෙයක්ම කළේ මගේ හින හැබෑ කරගන්න විතරක් නෙවෙයිනේ. දැන් කාලෙ දරුවන්ගේ අනාගතේ ගැන දෙමව්පියන්ට තියෙන රැකවරණය මොකක්ද ? දොස්තර විභාගෙ පාස් උනොත් දොස්තර කෙනෙක් හැටියට රස්සාවක් ලැබෙනව විශ්වාසයි. ප්‍රියංගනී දක්ෂයි. ඒකනෙ මං එයාව උනන්දු කළේ වැඩිපුර වැඩ කරන්න. විභාගෙට පාඩම් කරන්න.

පියා : මං මේ කතා කරන්නේ හොඳට කල්පනා කරල බලල. මම කැමති නෑ මේ වැඩේට සහභාගි වෙන්න. මෙච්චර කාලෙකට මේ ගෙදර හැම තීරණයක්ම ගත්තෙ ඔයා. දැන් මේ තීරණෙත් ඔයා අරන් ඉවරනෙ. අනික මම දැන් මෙතන හිටියොත් මගේ කටින් මොකක් හරි වැරදි දෙයක් පිටවෙලා මේ සේරම අවුල් වෙලා යන්න පුළුවන්. ඒ හින්දා මං දැන් ගෙදරින් පිටවෙලා ගිහින් ඒ මිනිස්සු ඇවිත් ගියාට පස්සෙ එන්නම්.

(පියා හෙමින් පා තබමින් පිටවී යයි)

මව : බොහොම හොඳයි. මේ සේරම මගේ කරපිට දාලා මඟ ඇරල යන්න. මෙච්චර කරපු මට මේ ටිකත් බැරි වෙන්නෙ නෑ.
චූටි.... ඔය කොස්ස ගෙනත් අතුගාපන්, බලපන් මේ ගෙයි හැටි.

01.
1. මෙම සංවාද ඛණ්ඩය අයත් නාට්‍යය සහ එහි නිර්මාණකරුවා නම් කරන්න. (ලකුණු 02)
2. මෙම නාට්‍ය කෘතියේ තේමාව සැකෙවින් දක්වන්න. (ලකුණු 02)
3. මෙහි දැක්වෙන චරිත යුගලය අතර පවතින ප්‍රතිවිරෝධී මත නිසා ඇතිවන තත්ත්වය නාට්‍ය මාධ්‍යය තුළ හඳුන්වන්නේ කුමන නමකින්ද ? (ලකුණු 02)
4. නාට්‍යය තුළ දැකිය හැකි මෙම චරිත යුගලයේ චරිත ලක්ෂණ කෙටියෙන් දක්වන්න. (ලකුණු 02)
5. මෙම චරිත දෙක හැරුනු විට නාට්‍යයේ තේමාව ඉස්මතු කිරීම සඳහා යොදාගත් වෙනත් චරිත 2 ක් නම් කරන්න. (ලකුණු 02)
6. මෙම නාට්‍යය පෙළ අධ්‍යයනය තුළින් ඔබ ලබාගත් ජිවිතාවබෝධය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

02. 1. ප්‍රාසංගික කලා යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද ? (ලකුණු 03)
2. ප්‍රාසංගික කලාවන් 3 ක් නම් කරන්න. (ලකුණු 03)
3. ඔබ නරඹා ඇති නාට්‍යය ක ප්‍රාසංගික ලක්ෂණ අන්තර්ගත ව ඇති ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

03. 1. "රංග භූමි අලංකරණය" යන්න සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 03)
2. රංග භූමි අලංකරණයක් නිර්මාණය කිරීමට ප්‍රථම, රංග භූමි අලංකරණ ශිල්පියා සැලකිලිමත් වන කරුණු 3 ක් දක්වන්න. (ලකුණු 03)
3. අසාර්ථක රංග භූමි අලංකරණයක් නිසා නාට්‍ය දර්ශනයට සිදුවන අවාසි 3 ක් විස්තර කරන්න. (ලකුණු 06)

04. "දක්ෂ රූපණ ශිල්පියෙකු බිහි කිරීමෙහිලා උපකාරී වන රංග අභ්‍යාස කායික හා මානසික වශයෙන් මූලික ප්‍රභේද 2 කි."
1. මින් කායික රංග අභ්‍යාස 3 ක් නම් කරන්න. (ලකුණු 03)
2. ඔබ කැමති රංග ක්‍රීඩාවක් සිදු කරන අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)
3. රංග අභ්‍යාස ප්‍රගුණ කිරීම නිසා ආධුනික නළුවකුට ඉන් අත්වන වාසි 3ඃ ක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

05. "විජය රජු කුවේණියට දුන් ප්‍රතිඥාව කඩ කිරීම හේතුවෙන්, ඔහුගෙන් පසුව රජ වූ පඬුවස් දෙව් රජුට දිවි දෝෂයක් වැළදුණු බවත්, එම දිවි දෝෂය සුව කිරීම සඳහා යාගයක් කරන ලද බව ඓතිහාසික පුරාවෘත්ත වල සඳහන් වේ."
1. මෙම පුරාවෘත්තය ට අදාළ ශාන්ති කර්මය නම් කොට, ඊට අයත් නාට්‍යමය පෙළපාලි 2 ක් නම් කරන්න. (ලකුණු 03)
2. ඉන් එක් පෙළපාලිය ක අන්තර්ගත කතා පුවත සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 03)
3. ඉහතින් විස්තර කළ පෙළපාලියෙහි දැකිය හැකි නාට්‍යමය ලක්ෂණ 6 ක් නම් කරන්න. (ලකුණු 06)

06. පහත දැක්වෙන ඡායාරූපය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



1. මෙම ඡායාරූපයේ දැක්වෙන චරිත යුගලය නම් කර, එම චරිත අන්තර්ගත ජන නාට්‍ය සම්ප්‍රදාය නම් කරන්න. (ලකුණු 03)
2. මෙම නාට්‍ය සම්ප්‍රදාය ප්‍රචලිත ව පැවති ප්‍රදේශ 3 ක් නම් කරන්න. (ලකුණු 03)
3. මෙම නාට්‍ය සම්ප්‍රදාය තුළ දැකිය හැකි ලක්ෂණ 6 ක් දක්වන්න. (ලකුණු 06)

07. "දක්ෂිණ භාරතීය "තෙරුක්කුත්තු " නාටක වල ආභාසයෙන් ලක්දිව ප්‍රචලිත වූ ජන නාටක විශේෂයක් ලෙස නාඩගම් නාට්‍ය කලාව හැඳින්විය හැකිය"
1. නාඩගම් නාට්‍ය ශෛලිය තුළ, දක්ෂිණ භාරතීය නැතහොත් ද්‍රවිඩ ආභාසයක් තිබූ බව දැක්වීමට පිළිගත හැකි සාක්ෂි 3 ක් දක්වන්න. (ලකුණු 03)
2. නාඩගම් නාට්‍ය රංග ශෛලිය තුළ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ 3 ක් විස්තර කරන්න. (ලකුණු 03)
3. නාඩගම් නාට්‍ය ශෛලිය අවගමනය ට බලපෑ හේතු 6 ක් දක්වන්න. (ලකුණු 06)